**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ රු. 27,697 ක දුන් වට්ටම් මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබීම නිසා මෙහෙයුම් වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වැඩ අවසන් කරන ලද කර්මාන්ත 06 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,016,546 ක් ණයහිමියන් යටතේ වෙන්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු රු. 54,000 ක් වූ ඉනිමඟක් රු. 5,400 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලී බඩු හා සවිකිරීම් රු. 48,600 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී මිලදී ගෙන තිබුණු රු. 32,100 ක් වූ සපත්තු කුට්ටම් 12 ක් ස්ථාවර වත්කම් ලෙස ලීබඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඉ) ණය ක්‍රමක්ෂය ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 20,950,164 ක් වුවත්, එය රු. 20,697,825 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 252,339 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**----------------------------**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු. 4,475,734 ක් වූ ණයගිම් ශේෂය උපයෝගී ලේඛන අනුව රු. 5,207,442 ක් වූයෙන් රු. 731,708 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

**----------------------**

ණයගිම් ලේඛනය අනුව, 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 8,389,536 ක ණයගිම් ශේෂයක් පැවති අතර, ඉන් එකතුව රු. 4,453,284 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**----------------------------------------------------**

1988 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු. 2,423,549 ක අත්තිකාරම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,924,307 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 4,188,432 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,735,875 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 2,735,875 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 03 ක රු. 5,377,106 ක වර්ධනය හා වියදම් විෂයයන් 01 ක රු. 1,409,154 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 4,248 | 8,365 | 5,615 |
| බදු කුලී | 2,716 | 2,071 | 259 |
| බලපත්‍ර ගාස්තු | 932 | 1,131 | 05 |
| වෙනත් ආදායම් | 58,685 | 34,783 | 6,109 |

### 2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමහ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 66, සියයට 27 හා සියයට 46 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, වරෙන්තු හා දඩ හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 31, සියයට 65 හා සියයට 42 කින් අඩුවී තිබුණි.

### 2.3.3 වරිපනම්

----------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ 2016 සැප්තැම්බර් 30 දිනට පැවති වරිපනම් ඒකක 1,683 කින් රු. 3,117,235 ක හිඟ වරිපනම් බදු 2016 ඔක්තෝබර් 20 දින වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වරිපනම් අයකරන ප්‍රදේශ පුළුල් කිරීම යටතේ ඕපනායක හා වැලිගෙපොල නගර ආසන්න ප්‍රදේශ දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර නව වරිපනම් බදු තක්සේරුව අනුව 2014 ජනවාරි 01 දින සිට වරිපනම් බදු ලේඛනගත කිරීමට පියවර ගෙන තිබුණු නමුත් එකී ප්‍රදේශයන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීමකින් තොරව වරිපනම් බදු අයකිරීම සම්බන්ධව ප්‍රදේශවාසීන්ගෙන් ඇතිවූ විරෝධතාවය හේතුවෙන් සභාවේ මාසික මහ සභා රැස්වීම් තීරණයක් මඟින් වරිපනම් බදු අයකිරීම තාවකාලිකව නතර කර තිබුණි. ඒ හේතුවෙන් 2014, 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් ලේඛනගත කල නමුත් අයකර ගැනීමට නොහැකි වූ රු. 3,070,656 ක වරිපනම් බදු ශේෂය කපා හැරීම සඳහා 2016 ජූලි 27 දින අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර තිබුණද, 2017 මැයි 31 දින වනවිටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

### 2.3.4 බදුකුලී

---------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 හා 2009 මාර්තු 09 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවත්, චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රථම වරට අයකර තිබූ බදුකුලිය තීරණය කරන ලද තක්සේරුව හෝ සභා තීරණය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඕපනායක පොල ඉදිරිපිට අංක 01 සිට 08 දක්වා වන කඩකාමර 1996 වර්ෂයේදී රු. 300 බැගින් මාසික කුලියකට බදු දී තිබූ අතර, 2007 වර්ෂයේදී රු. 600 දක්වා කුලිය වැඩිකර තිබුණි. එසේ වුවද, සංශෝධිත කුලිය ඇතුලත් කර නව ගිවිසුමකට එළඹීමට 2016 ඔක්තෝබර් 20 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවට අයත් සතිපොල 02 කින් හා මාළු ලැලි 02 කින් 2016 වර්ෂයට අදාල හිඟ බදුකුලී රු. 100,281 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එම හිඟ මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) 2016 සැප්තැම්බර් 30 දිනට ඒකක 89 කින් එකතුව රු. 63,551 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින ඒකක 74 කින් අයවිය යුතු රු. 60,492 ක් හෙවත්, මුළු හිඟ වටිනාකමින් සියයට 95 ක් ඇතුලත් වී තිබුණි.

### 2.3.5 වෙනත් ආදායම්

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති 05 කට අදාලව 2015 ජනවාරි 01 දින සිට 2016 ජූලි 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු. 498,489 ක් වූ හිඟ ජල බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ගලි බවුසරය මඟින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර, අපද්‍රව්‍ය ගෙනගොස් වැළලීමට ස්ථානයක් නොමැති හෙයින් ගලි බවුසරය කුලියට දීමේ හැකියාවක් නොමැති බව විගණනයට දන්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුල ඉදිකරන ලද සන්නිවේදන කුළුණු වල උස අනුව අයකල යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

2016 අප්‍රේල් සිට 2016 ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබියයුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2016 අප්‍රේල් සිට 2016 අගෝස්තු දක්වා කාලපරිච්ජේදයට අදාලව බලංගොඩ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබියයුතු රු. 448,299 ක් වූ උසාවි දඩ මුදල 2016 ඔක්තෝබර් 20 දින වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය අනුව සංවර්ධන ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු. 37,100,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද, වර්ෂය අවසාන වනවිට ඉන් එකදු කර්මාන්තයක් හෝ ඉටුකර නොතිබූ අතර, පළාත් සභා ප්‍රතිපාදන යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 7,677,615 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 20 ක් නිමකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සබරගමුව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව අනුව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය වී තිබූ කොඩිකණු 35 ක ඌනතාවය සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 22 දින වනවිටත් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබුණු එකතුව රු. 53,328 ක් වූ යන්ත්‍ර හා උපකරණ හා ලී බඩු හා සවිකිරීම්, වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මිය යාම, විශ්‍රාම යාම, ස්ථාන මාරු ලැබීම් හා සේවය හැර යාම යන හේතූන් මත නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 106,257 ක් වූ ණය ශේෂයක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, සභාව විසින් කසළ ශෝධනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ 9.4 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දරිද්‍රතාවය හේතුකොට ගෙන සභාව විසින් නිදහස් කරනු ලැබූ පදිංචිකරුවෙකු නොවන, කසළ ශෝධන සේවාව මගින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවකු විසින් සභාව නියම කරනු ලබන කසළ ශෝධන ගාස්තුවක් සභාව වෙත මාස්පතා ගෙවනු ලැබිය යුතු වුවද, සභාව විසින් කසළ ශෝධන සේවාව සඳහා ගාස්තු අයකිරීමට විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සභාව විසින් නගරයේ එකතු වන කසළ වර්ගීකරණයකින් තොරව කහවත්ත වැව්ලි සමාගම සතු විවෘත භූමියකට බැහැර කර කිසියම් කාල සීමාවකට පසුව කසළ මතට පස් තට්ටුවක් දැමීම පමණක් සිදු කරන බව සභාව විසින් විගණනයට දන්වා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම වූ රු. 7,870,368 ක් වන විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වර්ගීකරණ දෝෂ පැවතීම |
| | | (ii) | ගිණුම් වලින් අත්හැරීම තිබීම |
| | | (iii) | වෙන්කිරීම් සිදු නොකිරීම |
| | | (iv) | අඩුවෙන් සටහන් කිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් ලෙස බැහැර නොකිරීම |